රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2009

මගේ අංක: රාසේකො/ඊඑස්/චක්‍රලේඛ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක : 356 බී, ගාලු පාර, (කාල්විල් පෙදෙස)
කොළඹ 03.
2009 ජනවාරි මස 23 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටය.

2006 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම
<u>යටතේ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කිරීම</u>

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 61 බී වගන්තිය ප්‍රකාර කටයුතු කරමින් 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, එහි ඇමුණුම් අංක 1 හි 4.3 වගන්තිය අනුව එම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම උදෙසා සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කිරීම හෝ අලුතින් සම්පාදනය කරන ලෙස සඳහන් කර ඇත.

02. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (1) වගන්තිය ප්‍රකාර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා දැනට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටි සංශෝධනය කල යුතුය. ඒ අනුව අලුතින් සම්පාදනය කරනු ලබන සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

04 එබැවින්, සංශෝධනය කල යුතු සියලු සේවා ව්‍යවස්ථාවන්, බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටි ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව 2009 මාර්තු මස 31 දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

එච්.ඩී.එල්.ගුණවර්ධන.
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත් :

1. අග්‍රාමාත්‍ය ලේකම් -
2. අමාත්‍ය මණ්ඩල ලේකම් -

බ/-